Department Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

සතිය- 3

ශ්‍රේණිය-13

සකස් කළේ - කේ.කේ.අරුණා ශාන්ති
මිය,ර/ධර්මාලෝක ම.වි.

නිපුණතාව 9.0 – සංවර්ධනය සඳහා සන්නිවේදනය

නිපුණතා මට්ටම 9.1 ,9.2,9.3,9.4

1.) 1.සංවර්ධනය නිර්වචනය කිරීමේදී ඩඩ්ලි සියර්ස් පෙන්වා දුන් කරුණු ගෙනහැර දක්වන්න.
2.සංවර්ධන සන්නිවේදනයේ අරමුණු 4ක් කෙටියෙන් හඳුන්වා දෙන්න.
3.ප්‍රජා සංවර්ධනය සඳහා ප්‍රජා ගුවන් විදුලිය මැයෙන් පාසල් සඟරාවකට ලිපියක් සකස් කරන්න.

2.) 1.එක්සත් ජාතීන්ගේ සංවිධානය අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා ප්‍රකාශ කළ සන්නිවේදන ප්‍රවේශ හතර නම් කරන්න.
2.සන්නිවේදනය සංවර්ධන ක්‍රියාවලියේ ප්‍රධාන යටිතල පහසුකමක් ලෙස සලකා එමගින් සැපිරිය යුතු පහසුකම් හතරක් කෙටියෙන් පැහැදිලි කරන්න.
3.සංවර්ධන සන්නිවේදනය පැහැදිලි කර ගැනීම සඳහා පහත ස්වභාවයන් කෙටියෙන් විස්තර කරන්න.
1.ජනතා කේන්ද්‍රීයතාව
2.ප්‍රාදේශීයකරණය
3.සමාජීය සම්බන්ධතා හා සමානාත්මතා ගොඩනැගීම.
4.දරිද්‍රතාව අවම කිරීම.
5.ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා මැදිහත්වීම.

3.) 1.ඔබ ප්‍රදේශයේ සංවර්ධන ගැටළුවක් හඳුනාගෙන සංවර්ධන ව්‍යාපෘතියක් සැලසුම් කරන්න.
2.ශ්‍රී ලංකාවේ මාධ්‍ය සංවර්ධනය සඳහා ක්‍රියා කරන ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.
3.සංවර්ධන සන්නිවේදනය සඳහා යොදාගත හැකි සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රම හතරක් දක්වා ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

4.) 1.සංවර්ධන සන්නිවේදන කාර්යයේ නියැලෙන මාධ්‍යවේදියෙකු සතු විය යුතු මූලික කුසලතා රැසක් වේ.ඉන් හතරක් නම් කරන්න.
2.ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිවලදී ජනතාව දැනුම්වත් කිරීම සඳහා යොදාගත හැකි ශිල්ප ක්‍රම හතරක් කෙටියෙන් හඳුන්වන්න.

3.සංවර්ධන ව්‍යාපෘතියකදී ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම අත්‍යවශ්‍ය සාධකයකි.එය සාර්ථක කර ගැනීම සඳහා භාවිත කළ හැකි විධි ක්‍රම තුනක් පැහැදිලි කරන්න.

4.සංවර්ධන ව්‍යාපෘතියක් පිළිබඳ මූලික නිගමනවලට එළඹීම අදියර කිහිපයකින් යුත් ක්‍රියාවලියකි.එකී ක්‍රියාවලියේ මූලික අදියර හතරක් සවිස්තරව දක්වන්න.